# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,918 — 1970 අගෝස්තු 7 වැනි සිකුරාද — 1970.8.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 545 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 546 |
| කනතුරු-ඇමැතුම ... ... ... | — | අය-වැය ලේඛන ... ... ... | 547 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | 546 | විවිධ දැන්වීම ... ... ... ... | 549 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 51/39—ප. පා. දෙ.—එච්. බී. 7/1/29/1.

### ගම්සභා ආඥාපනත

#### 54 වැනි වගන්තිය යටතේ ආඥාවයි

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 54 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1969 පෙබරවාරි මස 18 වැනි දින, අංක 14,841/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වූ ආඥාවෙන් සංශෝධනය කරන ලද 1967 පෙබරවාරි මස 23 වැනි දින, අංක 14,737/1 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ අතුරුගිරිය ගම් ප්‍රදේශයේ ගම් සභාව පිළිබඳ ආඥාවෙහි (ආ) ඡේදයෙහි "ලංකා පරිපාලන සේවයට අයත් බර්ට් ලියනමාන මහතා" යන වචන වෙනුවට "කොළඹ කොට්ඨාසයෙහි සහකාර පළාත් පාලන කොමසාරිස් වරයා" යන වචන ආදේශ කිරීමෙන් ඒ ආඥාව වැඩි දුරටත් මෙයින් සංශෝධනය කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1970 ජූලි මස 26 වන දින,
කොළඹ දීය.

8-228—70.7.8 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

### ශුද්ධි පත්‍රය

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 10 (2) වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවන ලදුව, අංක 14,914/7 සහ 1970 ජූලි 15 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කැකිරාව සුළු නගර සභාවේ සභිකවරුන්ගේ නිල කාලය අවසන් විය යුතු දිනය වශයෙන් "1970 දෙසැම්බර් මස 31 වෙනුවට" "1971 ජූනි මස 30" යනුවෙන් සංශෝධනය විය යුතුය.

8-213—70.7.8 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

ඇල්. ඩබ්ලිව්. ජී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

# පළාත් පාලන සහා ජනද ආඥාපණත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

### (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 4 (1)(සී) වැනි වගන්තිය යටතේ ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ, ඇස්. නඩරාජා මහතා 1970 අගෝස්තු මස 17 වැනි දින සිට යාපනය දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ නිලධාරි වශයෙන් පත් කරන්නට යෙදුන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්
(ප්‍රදේශීය බලමණ්ඩල).

1970 ජූලි මස 23 වැනි දින,
කොළඹ 7 දී ය.

8–216—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත
### (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 ජූලි මස 22 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| **මාතලේ දිස්ත්‍රික්කය** | | |
| **කන්දපල්ල කෝරළේ ගම්සභාව** | | |
| 7 | ... | අළුත්ගෙදර සෙයියදු අහමදු |
| **රත්නපුර දිස්ත්‍රික්කය** | | |
| **මැද කෝරලේ හෙළ පල්ල පලාත ගම්සභාව** | | |
| 12 | ... | මල්ලිකා ආරච්චිගේ සැමියෙල් සිංඤෝ |

8–211—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

# ආදයම් වියදම්

## විශේෂ කොමසාරිස් කාර්‍යාලය ධර්ගා නගරය

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (2) යටතේ අයදුම්පත

### 1970 අයවැය ලේඛනය—1වන කොටස සාමාන්‍ය

1970 අයවැය ලේඛනයේ පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරු කර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට මා විසින් 1970 ජූලි මස 17 වන දින අංක 1 දරණ තීරණය අනුව සකස් කොට සම්මත කරන ලදී. :—

**මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| (1) නිළධාරි වැටුප් (අන් අන්දමකින් අය නොකළ)— | | |
| (ජී) විවාහක දීමනාව ... ... | 400 | 0 |
| (2) සංස්ථා වියදම්— | | |
| (සී) අයකැමි ගාස්තු ... ... ... | 500 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (2) කැළි කසළ— | | |
| (ඒ) වැටුප් ... ... ... | 1,750 | 0 |
| (3) වැසිකිළි ශෝධනය— | | |
| (ඒ) වැටුප් ... ... ... | 1,750 | 0 |
| (7) පොදු වෙළඳ පොලවල් හා ගාල්— | | |
| (ඒ) වැටුප් ... ... ... | 1,000 | 0 |
| | 5,400 | 0 |

**මුදල් අවශ්‍ය වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| (1) නිළධාරි වැටුප් (අන් අන්දමකින් අය නොකළ)— | | |
| (ඒ) ලේකම් ... ... ... | 850 | 0 |
| (2) සංස්ථා වියදම්— | | |
| (එෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රකාශණ හා කාර්‍යාලීය වියදම් ... | 3,000 | 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | |
| (1) වැටුප් ... ... ... | 500 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (බී) වැටුප් (කන්කානි) ... ... | 250 | 0 |
| (2) කැළි කසළ— | | |
| (බී) ගොන් සහ කරත්ත හා ලොරි ... ... | 800 | 0 |
| | 5,400 | 0 |

ලලිත් හෙට්ටිආරච්චි,
විශේෂ කොමසාරිස්, ධර්ගා නගරය.

1970 ජූලි මස 22 වන දා,
ධර්ගා නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්‍යාලයේදී ය.

8–226—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

# අය වැය

## දඹුල්ල සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි අංක 40 (2) යටතේ කෙරෙන අයදුම්පත්‍රයයි**

1970 වර්ෂයේ අය වැය ලේඛනය

මෙහි පහත ඉතිරි වැය ශීර්ෂ යටතේ දක්වෙන මුදල් ඒ සමග දක්වෙන වැඩිපුර වියදම් යටතේ සඳහන් ශීර්ෂවලට මාරුකර වැයකිරීමට 70.6.10 දින පවත්වනලද විශෙෂ සභා රැස්වීමේ අංක 2 දරණ යෝජනාව යටතේ සභා සම්මතකරනලදී :—

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | රු. ශ. | වැඩිපුර වැය අපේක්ෂිත වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|---|---|
| ඩී.1 (එච්) කාණු ඉදිකිරීම ... ... | 1,000 0 | ඩී.7 (ධී) ඉදිකිරීම ... ... ... | 4,200 0 |
| ඩී. 5 (ජී) ඉදිකිරීම ... ... ... | 2,400 0 | | |
| ඩී. 7 (ජී) වන්දි ... ... ... | 800 0 | | |
| | 4,200 0 | | 4,200 0 |

හෙ. වී. ප්‍රේමතිලක,
සභාපති,
දඹුල්ල සුළු නගර සභාව.

1970 ජුනි මස 27 වැනි දින,
දඹුල්ල සුළු නගර සභා කාර්යාලයේදී ය.

අනුමත කරමි.

කේ. එම්. අබේසිංහ,
මාතලේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1970 ජූලි මස 21 දින,
මාතලේ පළාත් පාලන කාර්යාලයේදී ය.

8-229—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## බලපිටිය සුළු නගර සභාව

**1970 අයවැය ලේඛනය**

මුදල් නියෝග 40 (II) යටතේ කෙරෙන අයදුම් පත

1970 අයවැය ලේඛනයේ ඒ ඒ වැය සිරස් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත පෙනෙන වැය සිරස යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය සිරසට මාරු කර අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම සිරස යටතේ යෙදවීමට 1970 ජූලි මස 2 වන දින පවත්වන්නට යෙදුන මාසික සභා රැස්වීමේදී අංක 2(i) දරන සම්මුති අංකය යටතේ සභා සම්මත විය. :—

| මුදල් ඉතිරි වැය සිරස | රු. ශ. | මුදල් අවශ්‍ය වැය සිරස | රු. ශ. |
|---|---|---|---|
| ඩී. 1(එච්) කාණු ඉදිකිරීම ... ... | 400 0 | ඒ. 2(බී) ගමන් ගාස්තු ... ... ... | 400 0 |

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය සුළු නගර සභාව.

1970 ජූලි මස 22 දින,
සුළු නගර සභා කාර්යාලය, බලපිටිය,

**දෙවන අතිරේක අය වැය ලේඛනය—1970**

| වැය සිරස | | රු. ශ. | ගණන් බලනලද වියදම සහ සභා සම්මුතිය |
|---|---|---|---|
| ඩී.2 (ඒ) කුලී | ... | 1,565 0 | 1970.3.21 දින අංක 1 |

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
සුළු නගර සභාව, බලපිටිය.

1970 ජූලි 22 දින,
සුළු නගර සභා කාර්යාලය,
බලපිටිය.

8-223—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## අම්බලන්ගොඩ නගර සභාව

**පළමුවැනි සප්පූරක අයවැය ලේඛනය—1970**

| වැය ශීර්ෂය | | මුදල | | අනුමතක බලය |
|---|---|---|---|---|
| ඒ. 1ඊ—විශ්‍රාම වැටුප් | ... | 6200 0 | ... | 1970.6.25 දින සභා සම්මුති අංක 22(9) |

1970.7.21 දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී ය.

සීලා ද සිල්වා
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපතිනිය.

8-220—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## කෑගල්ල නගර සභාව

### නගර සභා මුදල් රෙගුලාසි 12(II) යටතේ අයදුම්පත

### 1970 අයවැය ලේඛනය

1970 අයවැය ලේඛනයේ පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ ඉතිරිවේ යයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට 1970 ජූලි මස 9 වෙනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 16 දරණ සම්මුතියෙන් සභා සම්මත විය. :–

**ඉතිරිවන වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| බී—මහා මාර්ග :— | | |
| 12. නව කර්මාන්ත ... ... ... | 15,700 | 0 |
| ජේ—විදුලි අංශය :— | | |
| 4. පරිපාලන හා සාමාන්‍ය වියදම්— | | |
| (ඊ) උපදේශකයනට ගාස්තු ... ... | 4,000 | 0 |
| (ජී) විවාහක දීමනා ... ... | 1,500 | 0 |
| එකතුව ... | 21,200 | 0 |

**වැඩියෙන් වැය වන වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| බී—මහා මාර්ග :— | | |
| 7. සංවර්ධන කටයුතු ... ... ... | 9,200 | 0 |
| 8. සතුකොට ගැනීම ... ... ... | 6,500 | 0 |
| ජේ—විදුලි අංශය :— | | |
| 4. පරිපාලනය හා සාමාන්‍ය වියදම්— | | |
| (සී) මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය ... ... | 1,500 | 0 |
| (ඇජ්) විශ්‍රාම වැටුප් ... ... ... | 4,000 | 0 |
| එකතුව ... | 21,200 | 0 |

පූ. බ. බාලසූරිය,
සභාපති,
කෑගලු නගර සභාව.

1970 ක් වූ ජූලි මස 27 වෙනි දින,
කෑගල්ල, නගර සභා කාර්යාලයේදී ය.

8–215—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## වරකාපොල උප නගර සභාව

### 1970 පළමුවන පරිපූරක අය වැය ලේඛනය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | |
|---|---|---|
| සී. 2 (බී) ... ... | 540 | 0 |
| ජේ. 4 ... ... | 459 | 0 |
| | 999 | 0 |

1970 මාර්තු මස 31 වැනි දින පැවැත්වූ වරකාපොල උප නගර සභාවේ මාසික සභා රැස්වීමේ අංක 9 දරණ යෝජනාවෙන්, ඉහත සඳහන් පරිපූරක අය වැය ලේඛනය සභා සම්මත විය.

ඩබ්ලිව්. ඒ. ඇල්බට්,
සභාපති,
වරකාපොල උප නගර සභාව.

1970 ජූලි මස 12 වැනි දින,
වරකාපොල උප නගර සභා කාර්යාලයේ දීය.

අනුමත කරමි.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල.

1970 ක්වූ ජූලි මස 22 වැනි දින,
කෑගල්ල පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දීය.

8–219—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## පොල්ගහවෙල සුළු නගර සභාව

### 1970 වර්ෂයේ 1 වැනි පරිපූරක අයවැය ලේඛනය

### I වැනි කොටස—සාමාන්‍ය

| | රු. | |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම්— | | |
| 4. ආධාර දීමනා ... | 250 | ... 70.6.10 වැනි දින අංක 6 දරණ යෝජනාව |
| බී.—මංමාවත්— | | |
| 7. අත්පත් කර ගැනීම ... | 500 | ... 70.3.24 වැනි දින අංක 10 දරණ යෝජනාව |
| ඩී.—මහජන සෞඛ්‍යය— | | |
| 7. වෙළඳ සැල් හා ගාල් — (එජ්) අත්පත් කරගැනීම | 500 | ... 70.3.24 වැනි දින අංක 10 දරණ යෝජනාව |

1970.3.24 හා 70.6.10 දිනයන්හි පැවැත්වුණු සභා රැස්වීම්වලදී සම්මත කරගන්නා ලදී.

ජේ. ඒ. මුතුබණ්ඩා,
සභාපති,
සුළු නගර සභාව, පොල්ගහවෙල.

සුළු නගර සභා කාර්යාලය
පොල්ගහවෙල,
1970.7.16.

8–218—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## රක්වාන සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

1970 වර්ෂයේ අයවැය ලේඛණයේ ඒ ඒ සිරස් යටතේ වෙන් කරන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍ය වී ඇති අතිරේක වැය සඳහා එම සිරස් යටතේ යෙදවීමට 1970 ජූලි මස 24 වෙනි දින පවත්වන ලද මෙම සුළු නගර සභා රැස්වීමේදී යෝජනා අංක 10 යටතේ සම්මත විය:–

මුදල් ඉතිරි වැය ශීර්ෂ

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඩී. 2 (බී) | ගොන් කරත්ත හා ලොරි ... ... | 800 | 0 |
| ඩී. 2 (ඊ) | ජීවනාධාර හා වි. ජී. ආධාර ... ... | 2,000 | 0 |
| ඩී. 3 (එච්) | ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... | 2,000 | 0 |
| | | 4,800 | 0 |

මුදල් අවශ්‍ය වැය ශීර්ෂ

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ. 1 (ඩී) | කාර්යාල කාර්ය සහායක ... ... | 300 | 0 |
| සී. 4 | නඩත්තුව ... ... ... | 1,200 | 0 |
| සී. 7 | අළුත් කර්මාන්ත ... ... | 2,000 | 0 |
| ඩී. 1 (ජී) | බෙහෙත් සහ උපකරණ ... ... | 1,000 | 0 |
| ඩී. 2 (සී) | කසළ පුලුස්සන ස්ථාන ... ... | 300 | 0 |
| | | 4,800 | 0 |

වී. ටී. ජී. කරුණාරත්න,
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

1970 ක්වූ ජූලි මස 28 වෙනිදින,
රක්වාන සුළු නගර සභා කාර්යාලයේදී ය.

## රක්වාන සුළු නගර සභාව

### පළවෙනි අතුරු අයවැය ලේඛනය—විදුලිය

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඊඩී. 3 (ඒ) | උපකරන ... ... | 5,000 | 0 |
| ඊඩී. 10 | ජීවනාධාර ... ... | 3,000 | 0 |
| | | 8,000 | 0 |

වී. ටී. ජී. කරුණාරත්න.
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

1970 ක්වූ ජූලි මස 28 වෙනිදින,
රක්වාන සුළු නගර සභා කාර්යාලයේදී ය.

8-214—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## නිකවැරටිය ගම්සභාව

### ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1970 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බැවින්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන නිකවැරටිය ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙකක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 පරිච්ඡේදය) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| ඩබ්ලිව්. ඇස්. පෙරේරා ... | ඌරුමස් පමණි | නිකවැරටිය නගරයේ මහවපාරේ, අංක 18 දරණ ඩබ්ලිව්. ඇම්. පෙරේරාට අයිති කඩ කාමරය |

ජේ. පී. කරුණාතිලක,
සභාපති,
නිකවැරටිය ගම්සභාව.

1970.7.28 වැනි ද,
නිකවැරටිය ගම්සභා කාර්යාලයේ දීය.

8-212—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## කොබෙයිගනේ ගම්සභාව

### ගම්සභා ආඥාපනත—257 වන අධිකාරය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොබෙයිගනේ ගම්ප්‍රදේශයේ කොබෙයිගනේ ගම්සභාව විසින් 1970 ජූනි මස 29 දින පෙරවරු 9.30 ට ගම්සභා කාර්යාලයේ දී පවත්වන ලද ගම්සභා නියෝජිත රැස්වීමේදී සම්මතකර ගන්නා ලද අංක 13 දරණ යෝජනාව පරිදි පහත උපලේඛනයෙහි දක්වෙන ගැටදිවුල් වැව ග්‍රාමසංවර්ධන සමිතිය සහ ශ්‍රමදාන කඳවුර මගින් සද නිමකර ඇති පාර එකී ගම්සභාව වෙත පවරාගත් බව මහජනතාවගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ජේ. ඇම්. මුදියන්සේ,
කොබෙයිගනේ ගම්සභාවේ
සභාපති.

ගම්සභා කාර්යාලය,
කොබෙයිගනේ, 1970 ජූලි මස 25 දින දීය.

#### උපලේඛනය

| පවරා ගත් පාරේ නම හා විස්තර | දුර සැ. | දුර දා. | පළල අඩි |
|---|---|---|---|
| ගැටදිවුල්වැව සිට කලහේන දක්වා වෙල්යාය මැදින් වැටී ඇති පාර ... ... ... | 0 | 30 | 20 |

8-222—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නාම වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි:—

| | රු. | ශ. |
|---|---|---|
| අහලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අහලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අහලේ සෑම කොටසකටම සම්පූර්ණ අහලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරව පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළු දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | මෙරට ශ. | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලත දී එක කොටසක් ... ... | 0 50 | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | 1 00 | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 60 | 0 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නාට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | ... | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.10 සිකුරාද | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.17 සිකුරාද | ... | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.24 සිකුරාද | ... | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.31 සිකුරාද | ... | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | ... | 70. 8. 7 සිකුරාද | ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 8.14 සිකුරාද | ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.21 සිකුරාද | ... | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.28 සිකුරාද | ... | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 70. 9. 4 සිකුරාද | ... | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.11 සිකුරාද | ... | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.18 සිකුරාද | ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.25 සිකුරාද | ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 70.10. 2 සිකුරාද | ... | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10. 9 සිකුරාද | ... | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.16 සිකුරාද | ... | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.23 සිකුරාද | ... | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.30 සිකුරාද | ... | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | ... | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.11.12 බ්‍රහස්පතින්ද | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.20 සිකුරාද | ... | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.27 සිකුරාද | ... | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | ... | 70.12. 4 සිකුරාද | ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.11 සිකුරාද | ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.18 සිකුරාද | ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.24 බ්‍රහස්පතින්ද | ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.31 බ්‍රහස්පතින්ද | ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි